# 10 ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා වර්ධනය කර ගනී. | • භෛරවී සහ යමන් රාග විස්තර ලක්ෂණ ගී මගින්<br>• එම රාගවල ස්වර අභ්‍යාස<br>• එම රාගවල සර්ගම්<br>• එම රාගවල මධ්‍යලය ගීත | 1 ස්වර අභ්‍යාස, සර්ගම්, ලක්ෂණ ගීත යොදා ගනිමින් භෛරවී සහ යමන් රාග දෙකෙහි ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.<br>2 ලක්ෂණ ගීත ඇසුරින් භෛරවී යමන් රාග දෙක පිළිබඳ විස්තර කරයි.<br>3 ශිල්පීය දක්ෂතා ලැබීමට රාගධාරි සංගීතයේ ඇසුර ඉතා වැදගත් බව පිළිගනියි. | 03<br>03<br>03<br>03 |
| | 1.2 හින්දුස්ථානී තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත් වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | • හින්දුස්ථානී තාල පදවල අවනද්ධාක්ෂර සහ ඒවා තබ්ලාවෙන් වයන ආකාරය | 1 තබ්ලාවේ කොටස් හඳුනා ගනිමින් අවනද්ධාක්ෂර නිකුත් වන ආකාරය පැහැදිළි කරයි.<br>2. හින්දුස්ථානි තාලපද තබ්ලාවෙන් වැයීමට කැමැත්ත පල කරයි. | 04 |
| 2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර ලිපි බලා වාදනය කරයි. | • ස්වර ලිපි කියවීමේ ක්‍රමශිල්ප<br>• තනුවක් ස්වර ලිපි කිරීමේ ක්‍රමශිල්ප<br>• ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය<br>• තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි වාදනය. | 1 ශ්‍රී ලංකාවේ ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රය තුළ භාවිත වන සංකේත හඳුනා ගනිමින් ස්වර ප්‍රස්තාර කියවීමේ හුරුව ලබයි.<br>2. වෘත්තීය වාදකයෙකු වීමට අවශ්‍ය මූලික හැකියා වර්ධනය කර ගනියි.<br>3. තෝරාගත් භාණ්ඩයෙන් තම දක්ෂතා ඉදිරිපත් කළ හැකි, වාදනයෙහි නිපුණයෙකු බිහිවෙයි. | 02<br>02<br>03<br>03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ / රසාස්වාදයේ යෙදෙයි. | • ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරාගත් ගීත<br>• මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත හා නිර්මාණකරුවන්ගේ දායකත්වය<br>• කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය | 1. ග්‍රැමෆෝන් ගීත, මුල් යුගයේ ගුවන්විදුලි සරල ගී හා කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය වෙන්කොට දක්වයි.<br>2. එම ගීත ගයමින් රසාස්වාදයේ යෙදෙයි.<br>3. ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රයට ඉහත ගීත මගින් සිදු වූ මෙහෙය අගය කරමින්, ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි. | 02<br>02<br>02 |
| | 3.2 ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රසවිඳියි. | • ඩබ්ලිව්.බී.මකුලොලුව (දෙපානෝ ඇසුරින්)<br>• සී. ද. ඇස් කුලතිලකගේ නිර්මාණ (දැතට වළලු ඇසුරින්)<br>• රෝහණ බැද්දගේ (මල්සරා ගීතය ඇසුරින්)<br>• ලයනල් රංවල (ගම අවුලඤ්ඤයි ගීතය ඇසුරින්) | 1 දේශීය ජන සංගීතයේ උන්නතිය සඳහා කැප වූ සංගීතඥයින්ගේ ජීවන තොරතුරු රැස්කරයි.<br>2. ඔවුන්ගේ නිර්මාණ ග්‍රන්ථ හා කරන ලද සේවාවන් වෙන් කර දක්වමින් අගය කරයි. | 02<br>02<br>02<br>02 |
| | 3.3 උතුරු ඉන්දීය අධ්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි. | • හරිප්‍රසාද් චෞරාෂියා, රවි ශංකර්, ශබීර් හුසේන්, ජග්ජිත් සිං, රහ්මාන් යන සංගීතඥයින්ගේ නිර්මාණයක් ඇසුරින් | 1. භාරතීය වාද්‍ය ශිල්පීන්ගේ ජීවන තොරතුරු අධ්‍යයනය කරයි.<br>2. එම වාද්‍ය ශිල්පීන්ගේ වාදන කෘති රස විඳියි. මෙහෙයවීම වැනි විවිධ පෞරුෂ ගුණාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 04 |
| | 3.4 ලබාගත් සංගීතමය අත්දැකීම් ප්‍රාසංගිකව ඉදිරිපත් කරමින් සතුට ලබයි. | • වාර්ෂික විවිධ ප්‍රසංගය | 1. මෙතෙක් උගත් ගායන වාදන හැකියා ප්‍රසාංගිකව ප්‍රදර්ශනය කරයි.<br>2. ඉදිරිපත් වීම, සංවිධානය හා මෙහෙයවීම වැනි ගුණාංග ප්‍රගුණ කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 4.1 සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි. | • සෝ ගීවල ස්වභාවය<br>• ගුත්තිලය සහ සැළලිහිණි සන්දේශයේ කාව්‍ය ගායනා | 1. සැළලිහිණි සංදේශයේ හා ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගායනය කරයි.<br>2. විවිධ විරිත් හා බැඳුණු ගීතවල සම්ප්‍රදායික නාදමාලා අධ්‍යයනය කරයි.<br>3. සෝ ගී යන්න නිර්වචනය කරමින් කාව්‍ය රචනයේ හා ගායනයේ පෙළඹෙයි. | 04 |
| | 4.2 ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. | • ජන ගී වර්ගීකරණය හා විවිධ වර්ගයේ ජන ගී (මෙහෙගී, බැතිගී, සමාජගී, (ගැල්, පැල්, පාරු, පතල්)<br>• ආසාතාත්මක බව සහ අනාසාතාත්මක බව, ගැමි ගී නාමිකව හා ප්‍රායෝගිකව | 1. ජන ගී වර්ග කරයි, එක් එක් වර්ගවලට අයත් ගීත සම්ප්‍රදායික නාදමාලාව අනුව ගායනය කරයි.<br>2. ගැමි ගී නිර්වචනය කරමින් නිර්මාණයට බල පෑ හේතු සාධක විමසයි.<br>3. ආසාතාත්මක බව හා අනාසාතාත්මක බවෙහි වෙනස ප්‍රායෝගිකව ප්‍රදර්ශනය කරයි.<br>4. ගැමි ගී වර්ගීකරණය කරමින් අනාගත පරපුර සඳහා ගීත සංරක්ෂණය කළ යුතු බව පිළිගනියි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 සරල සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 5.1 උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණයේ රාගධාරී පසුබිම සාකච්ඡා කරමින් රස විඳිමින් ගීත ගායනයේ යෙදෙයි. | • බෛයිජු බවරා, මධුමතී, අභිමාන්, දෙව්දාස්, ජනක ජනක පායල් බාජේ (චිත්‍රපටයක එක් ගීතයක් ඇසුරින්) | 1. උතුරු ඉන්දීය චිත්‍රපටවල ඇති රාගාශ්‍රිත ගීත රස විඳියි. | 03 |
| | 5.2 ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මව්පිය ගුණ වරුණ සඳහන් ගීත ගායනයේ රස විඳියි. | • කඳුළු හෙලා නැඹිලියට/ඉපදුනු දා මා හඬා වැටෙන්නැති/ගමට කලින් හිරු | 2. ශ්‍රී ලංකාවේ සරල සංගීත ක්ෂේත්‍රයේ මව්පිය ගුණ ඇතුළත් ගීත ගයමින් අගය කරයි. | 03 |
| 6.0 රංග සම්ප්‍රදායන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 විවිධ ශෛලීන් ආභාශය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කර ගනිමින් ගායනයේ යෙදෙයි. | • නව නාට්‍ය සඳහා නාඩගම් ශෛලියේ ආභාසය ලැබීම (මනමේ සිංහබාහු කාලගෝල නාට්‍ය ඇසුරින්) එක් නාට්‍යයකින් එක් ගීතයක් බැගින් ගායනය/වාදනය | 1. නාඩගම් ශෛලියේ ආභාසයෙන් නිර්මිත නව නාට්‍ය පිළිබඳ අදහස් දක්වයි.<br>2. මනමේ, සිංහබාහු, ගීත ගයා / වයා අගය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 7.1 ගීපද රචනාවක සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් ගීපද නිර්මාණය කර තනු නිර්මාණය කරයි. | • පද රචනා ගීතයකට සුදුසු වන ආකාරය<br>• මාතෘකාවක් මත පද නිර්මාණය<br>• සුදුසු තනු නිර්මාණය<br>• කවියක් ගීතයක් වන අයුරු<br>• ගීතවත් දෙබස් | 1. සාර්ථක ගීතයක් වීමට ඇතුළත් විය යුතු අංග පැහැදිළි කරයි.<br>2. ගීතයේ තනුව හා පදමාලාව අතර ප්‍රසම්බන්ධය විග්‍රහ කරයි.<br>3. සදැස්, නිසදැස්, වශයෙන් කවි වර්ග කරයි.<br>4. කවියක්, ගීතයක් බවට පත් කළ හැකි උපක්‍රම සොයා බලයි. | 02 |
| 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 8.1 ශ්‍රවණ මාධ්‍යයෙන් ගීපද ප්‍රස්තාර කරයි. | • ජප්තාල් දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම<br>• සමග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ සහිත ගීපද ප්‍රස්තාරකරණය. | 1. විවිධ තාල පදනම් කර ගනිමින් ගීත ප්‍රස්තාර කිරිමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>2. සමග්‍රහ, අවග්‍රහ, විෂමග්‍රහ වශයෙන් ඇති වන වෙනස ප්‍රායෝගිකව දක්වයි.<br>3. විවිධ ග්‍රහයන් යෙදීම තුළින් ගීත මාධුර්යය වෙනස් විය හැකි බව පිළිගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 සංගීතයේ තාක්ෂණික මෙවළම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 9.1 නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි. | • නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය<br>• තාරතාවය, විපුලතාවය, ධ්වනිගුණය<br>• සප්තකයේ ස්වර සංඛ්‍යාත | 1. නාද ශබ්ද අතර වෙනස දක්වමින්, විද්‍යාත්මකව සංසන්දනය කරයි.<br>2. නාද උත්පාදනය හා නාදයේ ත්‍රිවිධ ගුණ පිළිබඳ විද්‍යාත්මක චින්තනයේ යෙදෙයි.<br>3. ස්වරයන්ගේ සංඛ්‍යාතයන් ගණනය කරයි.<br>4. සංගීතයේ ඇති භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරයි. | 06 |
| | 9.2 සංගීත අධ්‍යයනයේ, නිර්මාණයේ සහ සංරක්ෂණයේ දී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදෙයි. | • Playing & Recording Music with computer<br>• E-Learning, E-Music (MIDI)<br>• E-Encyclopedia & Music<br>• Music learning through Internet | 1. සංගීත අධ්‍යයනය කිරීම හා සංගීත නිර්මාණය සඳහා පරිගණකය යොදා ගනී.<br>2. අන්තර් ජාලය අතර වෙනස දක්වමින්, විද්‍යාත්මකව සංසන්දනය කරයි. | 08 |